## පළමුවන දේව ප්‍රකාශනය

ජෝවෙල් 2:12-18

ජෝවෙල් දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**(වත ඉරාගෙන නොව, සිත ඉරාගෙන, නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න.)**

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක. "උපවාසයෙන්, ද වැලපීමෙන් ද මුළු සිතින් දත් වත් මා වෙත හැරී එන්න. වත ඉරාගෙන නොව, සිත ඉරාගෙන, නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. මන්ද එතුමාණෝ, කරුණාභරිත, දයාන්විත, වහා නොකිපෙන, තිර පෙමින් සමන්විත, කමා වීමට කැමැති දෙවි කෙනෙකි. සමහරවිට එතුමාණන් සිය සිත වෙනස් කරගෙන කමා වී අපට ආශිර්වාද කිරීම නිසා, අහාර පූජා ද පානීය පූජා ද ඔබේ දෙවි සමිඳුන්ට ඔප්පු කරන්නට හැකිවනු ඇත්ද යි කවරෙක් දනිත් ද? සියොන් කන්දේ හොරණෑව පිඹින්න. උපවාසයක් පණවා, අයැදුමට සෙනග රැස් කරන්න. සෙනග එක්රැස් කරන්න. ශුද්ධ සභාවට ඔවුන් සූදානම් කරන්න. ප්‍රජා මූලිකයන් එකතු කරන්න. ළමයින් ද කිරි දරුවන් ද ගෙන එන්න. මනාලයා සිය යහන් ගබඩාවෙන් ද මනාලිය සිය නිදන කුටියෙන් ද පිටත එත්වා! ද්වාර මන්ඩපය හා පූජාසනය අතර සිටින සමිඳුන්ගේ සේවක පූජකයෝ හඬා වැළපෙමින්, 'සමිඳුනි, ඔබේ සෙනගට අනුකම්පා කළ මැනව. ඔබේ දෙවියෝ කොයි දැයි ජාතීන් අතරේ කීමට ඉඩ නොහැරිය මැනැවැ' යි කියත්වා!" එවිට සමිඳාණන් වහන්සේ දේශය ගැන උද්යෝගවත් වී සෙනගට අනුකම්පා කළ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 51:1-4, 10-13, 15

පිළිතුර: දෙවිඳුනි, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව.

ගීය: දෙවිඳුනි, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව. ඔබේ විපුල දයාවෙන් මාගේ අපරාධ මකා දමුව මැනව. මාගේ කෙලෙස් මලින් මා මුළුමනින් සෝදාලුව මැනව. මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව.

මාගේ අපරාධ මම මැනවින් දනිමි. දිවා රෑ දෙක්හි මාගේ පාප මට සිහි වේ. ඔබට විරුද්ධ ව, ඔබට පමණක් විරුද්ධ ව මම පව් කළෙමි. ඔබ හමුවෙහි මම නපුර කළෙමි. එබැවින් ඔබේ තීන්දුව සාධාරණ ය; ඔබේ විනිශ්චය යුක්ති සහගත ය.

දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව. තිරසර නව ආධ්‍යාත්මයක් මට දුන මැනව. ඔබ හමුයෙන් මා පලවා නොහැරිය මැනව. ඔබේ ශුද්ධාත්මය මා කෙරෙන් ඉවත් නොකළ මැනව.

විමුක්තියේ ප්‍රීතිය මට යළි දුන මැනව. අවනත සිතක් දී මා දරුව මැනව. එවිට මම අපරාධකරුවන්ට ඔබ මග පහදා දෙන්නෙමි. පව්කරුවන් ඔබ වෙත හරවාගෙන එන්නෙමි. සමිඳුනි, ගී ගැයුමේ වරම මට දුන මැනව. එවිට මා මුවින් ඔබ පැසසුම් ගයන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය

2කොරින්ති 5:20-6:2

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

**මෙය ප්‍රසාදජනක කාලයයි. සමිඳුන් වෙත හැරී එන්න.**

දෙවියන් වහන්සේ ම අප මගින් ඔබ හට ආයාචනා කරන්නාක් මෙන්, අපි ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් තානාපතියන් වී, දෙවියන් වහන්සේ හා සමගි වන ලෙස, ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් ඔබට ආයාචනා කරමු. දෙවියන් වහන්සේ, පාපය නොදත් ක්‍රිස්තුස් වහන්සේ, අප උදෙසා මනුෂ්‍ය පාපී බව හා සම වීමට සැලසූ සේක. එසේ කළේ ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකමට අප පංගුකාර වන පිණිස ය. එබැවින් දේව සේවයේ පංගුකාරයන් වශයෙන් ඔබ ලබා ඇති දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය අපතේ නොහරින ලෙස අපි ඉල්ලා සිටිමු. මන්ද, "ප්‍රසාදජනක කාලයේ දී මම ඔබට සවන් දුනිමි. ගැළවීමේ දවසේ දී මම ඔබට පිහිට වුනෙමි" යි දෙවියන් වහන්සේ වදාරණ සේක. මෙය ප්‍රසාදජනක කාලයයි. මෙය ගැළවීමේ දවස යි.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ගීතාවලිය51:10-12

ක්‍රිස්තුස් ස්වාමින් වහන්සේට මහිමයත්, ප්‍රශංසාවත් නිරන්තරයෙන් අත්වේවා!
දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව. තිරසර නව ආධ්‍යාත්මයක් මට දුන මැනව. විමුක්තියේ ප්‍රීතිය මට යළි දුන මැනව; අවනත සිතක් දී මා දැරුව මැනව.
ක්‍රිස්තුස් සවාමින් වහන්සේට මහිමයත්, ප්‍රශංසාවත් නිරන්තරයෙන් අත්වේවා!

## ශුද්ධවූ සුවිශේෂය

මතෙව් 6:1-6, 16-18

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**රහසින් කරන දේ දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක.**

මිනිසුන්ට පෙනෙන පිණිස ලෝකයා ඉදිරියෙහි ඔබේ පුන්‍ය ක්‍රියා නොකරන්න බලාගන්න. එසේ කළහොත්, ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන් වහන්සේගෙන් කිසි විපාකයක් ඔබට නොලැබෙන්නේය. එබැවින් ඔබ දන් දෙන කල, මිනිසුන්ගෙන් ප්‍රශංසා ලබන පිණිස ධර්මශාලාවල දීත්, විථිවල දීත් කෛරාටිකයන් කරන්නාක් මෙන් ඔබට පෙරටුවෙන් හොරණෑ නොපිඹින්න. සැබැවින්ම, මම ඔබට කියමි, ඔවුන්ගේ විපාකය ඔවුන්ට දැනටම ලැබී ඇත. එහෙත්, ඔබ දන් දෙන කල, දකුණත කරන දෙය වමතට නොදැනේවා. ඒ දන් දීම රහසක්ව තිබිය යුතුය. එවිට රහසින් එය දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක. ඔබ යාච්ඤා කරන කල කෛරාටිකයන් කරන්නාක් මෙන් නොකරන්න. මිනිසුන්ට පෙනෙන පිණිස ඔව්හු ධර්මශාලාවලත්, මංසන්ධිවලත් සිටගෙන යාච්ඤා කිරීමට ප්‍රිය වෙති. සැබවින්ම මම ඔබට කියමි, ඔවුන්ගේ විපාකය දැනටම ඔවුන්ට ලැබී ඇත. එහෙත්, ඔබ යාච්ඤා කරන කල ඔබේම ඇතුළු කාමරයට වැද, දොර වසාගෙන, අදෘශ්‍යමාන ව වසන ඔබේ පියාණන් වහන්සේට යාච්ඤා කරන්න. එවිට රහසින් ඔබ කරන දේ දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක. ඔබ උපවාස කරන කල කෛරාටිකයන් මෙන් දොම්නස් මුහුණු ඇතිව නොසිටින්න. තමන් උපවාස කරන බව මිනිසුන්ට පෙනෙන පිණිස ඔව්හු මුහුණු විරූප කරගනිති. සැබවින්ම මම ඔබට කියමි ඔවුන්ගේ පල විපාක දැනටම ඔවුන්ට ලැබී ඇත. එහෙත්, ඔබ උපවාස කරන කල, හිස තෙල් ගල්වා, මුහුණ සෝදාගන්න. මෙසේ, අදෘශ්‍යමාන ව වසන ඔබේ පියාණන් වහන්සේට මිස, ඔබ උපවාස කරන බව මිනිසුන්ට නොපෙනෙයි. එවිට රහසින් කරන දේ දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.